# බස්නාහිර පළාත්
# අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ
# කරදියාන මිහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ රියදුරු (බර වාහන)
# තනතුර සඳහා බඳවා ගැනීමේ දැන්වීමයි

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ කරදියාන මිහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ රියදුරු(බර වාහන )තනතුර සඳහා කාර්යය පැවරීමේ පදනම මත දෛනික ගෙවීම් යටතේ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***රියදුරු(බර වාහන)-තනතුරු 01***

පත්වීමේ ස්වභාවය : දෛනික
දෛනික වේතනය : රු.3000 /-
සුදුසුකම් : අ.පො.ස.(සා.පෙ.) විෂයන් 06 ක් එකවර සමත්වීම සහ මනා යාන්ත්‍රික දැනුම, වලංගු රියදුරු බලපත්‍රය (මගීන් 32 නොඅඩු) රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, පළාත් අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වසර 06 ක පළපුරුද්ද හා මනා ඇස් පෙනීම . කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව හෝ දන්වා එවනු නොලැබේ.

**වෙනත් කරුණු**

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතෙහි ඇතුලත් කරනු ලබන අධ්‍යාපන සුදුසුකම් සහ පලපුරුද්දට අදාල සහතිකපත්වල පිටපත් අයදුම්පත සමග අධිකාරියේ විද්‍යුත් ලිපිනයට(wmawp.gov@gmail.com) හෝ ලියා පදිංචි තැපෑලෙන 2026.01.09 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය. නිසිලෙස සම්පූර්ණ කර නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ඉල්ලුම්පත් යොමුකල යුතු ලිපිනය**

**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය** (බ.ප.)
තුම්බෝවිල, කරදියාන, පිළියන්දල.
2026.01.27